www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: ආන්ඩුව විශ්වවිද්‍යාල පුද්ගලීකරනය වේගවත් කරයි

## Sri Lankan government pushes university privatisation

**කපිල ප්‍රනාන්දු විසිනි**

**2010 ජුලි 24**

මහජන වියදම් තවදුරටත් කප්පාදු කිරීමේ කොටසක් ලෙස විශ්ව විද්‍යාල අධ්‍යාපනය පුද්ගලික ව්‍යාපාරවල මට්ටමට පත් කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීමට ආන්ඩුව පියවර ගනිමින් සිටියි. බලයට පත් කොලඹ ආන්ඩු විසින් ඇතිකල නිදහස් අධ්‍යාපනයේ පරිහානිය පෙන්නුම් කරමින් ඇමතිවරු ද මාධ්‍ය ද එයට පිලියම් යෙදිය හැක්කේ පුද්ගලික අංශයට පමනක් බව කියා සිටිති.

පසුගිය මාසය අග භාගයේ ජාතික අධ්‍යාපන කොමිසම (ජාඅකො) නිකුත් කල ''උසස් අධ්‍යාපනය සහ තාක්ෂනික හා වෘත්තීය අධ්‍යාපනය පිලිබඳ ප්‍රතිපත්ති සැලසුම'' නම් වාර්තාව මගින් ආන්ඩුවේ පිලිවෙත ගෙනහැර දැක්වීය. ග්‍රාමීය හා නාගරික පාසල් අතර අසමානතාවය, පාසල් හා විශ්වවිද්‍යාලවල තත්වය පහත වැටීම, විශ්වවිද්‍යාල පහසුකම් ප්‍රමානවත් නොවීම හා උපාධිධාරී සේවා වියුක්තිය ද ඇතුලු විශ්ව විද්‍යාල හා පැසැල්වල පිරිහෙන තත්වය පිලිබඳව එම වාර්තාව කරුනු දක්වයි.

වාර්තාව පෙන්වා දෙන්නේ 2006 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයට පෙනී සිටි ශිෂ්‍යයන්ගෙන් සියයට 58 කට හා විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූ සියයට 85 කට විශ්වවිද්‍යාල වරම් අහිමිවූ බවයි. "ප්‍රාථමික මට්ටමේ දී සෑම ශිෂ්‍යයෙකුට ම පාහේ අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව තිබෙන නමුත් ද්විතීයික හා තෘතීයික මට්ටමේදී දුප්පත් හා පොහොසත් පරතරය ද ඉහල යන පුද්ගලික පන්ති ගාස්තු ද සලකා බැලීමේ දී පෙනී යන්නේ පහල ආදායම් ලබන පවුල්වල ලමුන්ට උසස් අධ්‍යාපනයට පිවිසීමට ඇති හැකියාව කෙරෙහි එය අවාසිදායක ලෙස බලපා ඇති බව" යයි එහි සඳහන් වේ.

අවශ්‍ය වන්නේ නිදහස් අධ්‍යාපනයේ සෑම අදියරක් සඳහාම මහා පරිමානයෙන් අරමුදල් සම්පාදනය කිරීමයි. එහෙත් රජයේ ප්‍රතිපාදන සැලකිය යුතු තරම් ඉහල නැංවිය යුතු බව කියා සිටින අතරම ජාඅකො වාර්තාව අවධාරනය කරන්නේ, ''උසස් අධ්‍යාපනය තුල රාජ්‍ය-පුද්ගලික හවුල්කාරීත්වය ප්‍රවර්ධනය කිරීමත්'' උසස් අධ්‍යාපනය තුල රාජ්‍ය නොවන අංශයේ සහභාගීත්වය දිරිමත් කරන පරිසරයක් නිර්මානය කිරීමත් ය.

ජනාධිපති මහින්ද රාජපක්ෂ දැනටමත් පැහැදිලිව පෙන්නුම්කර ඇත්තේ ඔහුගේ ආන්ඩුව කැප වී සිටින්නේ අධ්‍යාපන වියදම් ඉහල දැමීමට නොව ඒවා කපා දැමීමට බවයි. මෑත දී ඉදිරිපත් කල ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශ මත සැකසුනු අයවැය වාර්තාවෙන් මෙම වසරේ අය-වැය පරතරය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8 දක්වා තියුනු ලෙස කපාහැරීමේ සැලසුම් එලිදක්වා ඇත. අධ්‍යාපනය වෙනුවෙන් ආන්ඩුවේ වියදම් කප්පාදුව කොතෙක් ද යත් 2006 වසරේ දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.67 වූ අධ්‍යාපන ප්‍රතිපාදන 2009 වන විට සියයට 2.08 දක්වා අඩු කර ඇත. 2010 අය-වැය මගින් අධ්‍යාපන ප්‍රතිපාදනවල කිසිදු වැඩිකිරීමක් සිදුව නැත.

''නිරන්තරයෙන් පුලුල් වන උසස් අධ්‍යාපනයේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අරමුදල් සොයාගැනීම මෙන්ම අවශ්‍ය වියදම් දැරීම පිලිබඳ ගැටලුවට රටවල් බොහොමයක් මුහුන දී සිටී'' යනුවෙන් ජාඅකො වාර්තාව සඳහන් කරයි. එය තවදුරටත් දක්වන්නේ ''උසස් අධ්‍යාපනයේ සම්පූර්න මූල්‍ය වගකීම රජය පමනක් දැරිය යුතුය'' යන්න දැන් පිලිගැනෙන සම්මතයක් නොවන බවයි. එබැවින් උපාධිධාරීන් සඳහා රැකියා ලබාදීමත් සිසුන් සඳහා අමතර අවස්ථා සලසා දීමත් පිනිස පුද්ගලික ආයෝජන දිරිමත් කල යුතු ය.

ජානාධිපති යටතේ ක්‍රියාත්මක වන ජාඅකො මේ පෙනී සිටින්නේ හුදෙක්ම ආන්ඩුවේ කප්පාදු වැඩපිලිවෙල සාධාරනීකරනය කිරීම වෙනුවෙන්ය. අයවැයෙන් ප්‍රකාශයට පත්කලේ ''විශ්වවිද්‍යාලවලට ඇතුලත්වීමට සුදුසුකම් ලැබූවත් සීමිත ඉඩ ප්‍රස්ථා හේතුවෙන් ඒ සඳහා අවස්ථාව නොලබන සිසුන්ට විශ්වවිද්‍යාලයකට ප්‍රවිෂ්ටවීමේ අවස්ථාව සැලසීම සඳහා ආන්ඩුව පුද්ගලික අංශය සමග හවුල්කාරීත්වයක් ගොඩ නගා ගැනීමට යෝජනා කරයි'' යනුවෙනි.

මෙකී ක්‍රියාමාර්ග වලින් දුප්පත් සිසුන්ට සහන සැලසෙන බව පැවසීම ප්‍රෝඩාවකි. පුද්ගලික විශ්වවිද්‍යාල ශිෂ්‍යන්ගෙන් විශාල මුදල් ප්‍රමානයක් අය

කරනු ලබයි. උදාහරන වශයෙන් ඕස්ට්‍රේලියානු මොනෑෂ් විශ්වවිද්‍යාලයට අනුබද්ධ ශ්‍රී ලංකා ආයතනයේ කලා අංශයේ දෙවන වසර ඩිප්ලෝමා පාඨමාලාව සඳහා වාර්ෂිකව අයකරන ගාස්තුව ඇ.ඩො. 4,000 ක් එනම් රුපියල් හාර ලක්ෂ පනස් දහසකට වැඩිය. මෙය ශ්‍රී ලංකාවේ හොඳ වැටුප් ලබන කම්කරුවෙකුගේ වාර්ෂික වැටුපට ද වඩා බෙහෙවින් වැඩි අගයකි.

ඕස්ට්‍රේලියාවේ ව්‍යාපාර හා තාක්ෂන විද්‍යාලය ව්‍යාපාර හා පරිගනක තාක්ෂන පාඨමාලාවේ මූලික වැඩසටහන සඳහා පමනක් වසරකට අය කරන මුදල සාමන්‍යයෙන් රුපියල් දෙලක්ෂ හතලිස් දහසකි. ද ඒෂියන් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි ඇන්ඩ් මැනේජ්මන්ට් ආයතනය විසින් රුසියාවේ නිස්නි නොවොග්‍රාද් මෙඩිකල් ඇකඩමියට අනුබද්ධව මෙරට පිහිටුවා ඇති පුද්ගලික වෛද්‍ය විද්‍යාලය එහි සිව් අවුරුදු පාඨමාලාව සඳහා රුපියල් මිලියන හයක් අය කරනු ලබයි.

අනෙක් අතට ධනවත් සිසුන් පුද්ගලික ආයතනවල අධ්‍යාපනය සඳහා ඇතුල් වුවත් එමගින් රජයේ විශ්වවිද්‍යාලවල ඉඩ ප්‍රස්ථා වැඩිවීමක් සිදු නොවනු ඇත. පුද්ගලික අධ්‍යාපනය වර්ධනය වීමට සමගාමීව නිදහස් අධ්‍යාපනය පරිහානියට පත්වනු ඇති අතර එමගින් පන්ති දෙකක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කරනු ඇත. එනම් ඉහල මිලක් ගෙවීමට හැකි පිරිස සඳහා තත්වයෙන් උසස් අධ්‍යාපන ආයතන ද විශ්වවිද්‍යාලයකට ඇතුලුවීමට වරම් ලැබුනත් ඔවුන් සඳහා ගරා වැටුනු, තද බදයෙන් යුත් ඌන ප්‍රතිපාදන සහිත රජයේ විශ්වවිද්‍යාල වශයෙනි.

රජයට අයත් 'සන්ඩේ ඔබ්සර්වර්' පුවත්පතට ජූලි 18 වන දින දුන් සම්මුඛ සාකච්ඡාවකදී උසස් අධ්‍යාපන ඇමති එස්.බී. දිසානායක, මෙකී ප්‍රතිපත්තියේ නියම අරමුන කෙලින්ම කියා සිටියේ මෙලෙස ය. ''අපට විශාල විදේශ විනිමයක් ඉතුරු කරගත හැකි වන අතර විදේශ සිසුන් දේශීය විශ්වවිද්‍යාලවලට ආකර්ෂනය කරගැනීමෙන් විදේශ මුදල් උපයා ගැනීමට ද හැකිවනු ඇත, මගේ තක්සේරුවට අනුව අපි මෙහි ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාල 15ක් 20 ක් අතර ප්‍රමානයක් ආරම්භ කල හොත් ඊලඟ වසර 10 තුල දී අපගේ ප්‍රධාන විදේශ මුදල් උපයන්නා බවට උසස් අධ්‍යාපනය පත් වනු ඇත. මෙය මගේ ඉලක්කයයි.''

ශ්‍රී ලංකාව තුල ලාභදායී නව පුද්ගලික විශ්වවිද්‍යාල කර්මාන්තයක් නිර්මානය කිරීම සඳහා රැකියා විරහිත විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ ලාභ ශ්‍රමය යොදා ගැනීමේ දිසානායකගේ සැලසුම් දැනටමත් බෙලිකපන මට්මටමේ පවතින ගෝලීය වෙලඳපල තුල කිසිසේත් සාර්ථක නොවනු ඇත. නිශ්චිතව ම සිදුවනු ඇත්තේ ලෝකය පුරා ආන්ඩු විසින් මහජන සේවාවන් කප්පාදු කිරීමේ වැඩපිලිවෙලට සමගාමීව ආන්ඩුව ද මුදල් ප්‍රතිපාදන කපා හැරීමත් සමග පොදු විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ පරිහානිය දිගටම සිදුවීමයි.

කම්කරු පන්තියේ නොයෙකුත් අරගලවල ප්‍රතිඵලයක් ලෙස දෙවන ලෝක යුද්ධයෙන් පසුව නිදහස් අධ්‍යාපනය ව්‍යාප්ත විය. 1983 දී දෙමල විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව එක්සත් ජාතික පක්ෂය වර්ගවාදී යුද්ධය ආරම්භ කිරීම සමඟ අත්වැල් බැඳගෙන උත්සන්න කෙරුනු නිදහස් වෙලඳපොල ගැති න්‍යාය පත්‍රය සමග නිදහස් අධ්‍යාපනයේ විනාශය බැඳී පැවතුනි.

බලයට පත් සෑම ආන්ඩුවක් විසින්ම පුද්ගලික ආයතනවලට බලපත්‍ර ලබාදෙමින් හා රජය විසින් පවත්වාගෙන යන විශ්වවිද්‍යාල තුලම මුදල් අයකරන පාඨමාලා ඇති කිරීම මගින් නිදහස් අධ්‍යාපනයට එරෙහිව ප්‍රහාර එල්ල කෙරුනි. දැන් ගැඹුරු ආර්ථික අර්බුදයක් හමුවේ රාජපක්ෂ ආන්ඩුව සූදානම් වන්නේ දිග් ගැසුනු සිවිල් යුද්ධය තුල පිරියම් කරගත් පොලිස් රාජ්‍ය විධික්‍රම භාවිතා කරමින් පෙරනොවූ විරූ ප්‍රහාරයන් එල්ල කිරීමටයි. පසුගිය වසරේ මෙන්ම මෙම වසරේ මුල් භාගයේ ද ශිෂ්‍ය විරෝධතාවයන්ට දරුනු ලෙස පහර දීම සඳහා ආන්ඩුව පොලීසිය යොදා ගත්තේ ය.

ආන්ඩුවට එරෙහිව සමාජවාදී ප්‍රතිපත්ති මත පදනම්වූ ස්වාධීන දේශපාලන අරගලයකින් තොරව නිදහස් අධ්‍යාපනය රැකගැනීම හෝ එහි තත්වය ඉහල නංවා ගැනීම කල නොහැකි දෙයකි. එහෙත් පසුගිය සතියේ පේරාදෙනිය හා කැලනිය සරසවි තුල පැවැත්වුනු විරෝධතා තුලදී වර්තමාන ශිෂ්‍ය සංවිධානවල නායකත්වය විසින් වැලැක්වීමට උත්සාහ කලේ ද හරියටම එවන් යොමුවකි.

උදාහරන වශයෙන්, අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය (අවිශිබම) දිගටම කියා සිටින්නේ ශිෂ්‍ය බලපෑම් මගින් ආන්ඩුවේ ප්‍රතිපත්ති වෙනස් කල හැකි බවයි. අවිශිබම කැඳවුම්කරු උඳුල් ප්‍රේමරත්න මාධ්‍ය වෙත ප්‍රකාශ කලේ තම සංවිධානය ''මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහනක්'' දියත් කිරීමට යන බවය. ''අනතුරුව උද්ඝෝෂන හා පන්ති වර්ජන කරා යොමුවන බවත් ආන්ඩුව විරෝධතා නො සලකා හැරියොත් ඊලඟට උපවාසයක් පටන් ගන්නවා'' යනුවෙනි.

අවිශිබම යනු රාජපක්ෂගේ මැතිරවරන ජයග්‍රහනයට ද කොටි සංවිධානයට එරෙහිව ඔහු නැවත පටන්ගත් යුද්ධයට ද සහාය දුන් හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කල හමුදාවේ සෑම ක්‍රියාවකටම සහාය දෙමින් ශිෂ්‍යයන් හා කම්කරුවන් යුද ව්‍යායාමය වෙනුවෙන් කැපකිරීම් කල යුතු යයි නිර්දේශ කල සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුනේ ශිෂ්‍ය සංවිධානයයි. දැන් ආන්ඩුවේ දේශපාලන විරුද්ධවාදීන් ලෙස පෙනී සිටිය ද අවිශිබම හෝ ජනතා විමුක්ති පෙරමුනට, රාජපක්ෂට හෝ ඔහුගේ වෙලඳපල ගැති

ප්‍රතිපත්තිවලට අභියෝග කිරීමේ දේශපාලන සටනක් සඳහා නායකත්වය දීමේ කිසිදු අරමුනක් ඇත්තේ නැත.

ශිෂ්‍යයන් තුල පවත්නා කෝපය හා අතෘප්තිය ගසාකමින් අවිශිබම මේ ආකාරයේ සීමිත විරෝධතා සංවිධානය කරන්නේ එම විරෝධයම වාෂ්පකර හැරීමටත් තම සෝදාපාලුවූ අක්ත පත්‍ර අලුත් කර ගැනීමටත් ය. ජනවාරි මාසයේ දී විරුද්ධ පක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වූ හිටපු ජනරාල් සරත් ෆොන්සේකා සමග ජනතා විමුක්ති පෙරමුන හවුලක් ගොඩනඟාගෙන සිටියි. මේ වන විට ෆොන්සේකා ගොතන ලද චෝදනා යටතේ අත්අඩංගුවේ තබා ඇති නමුත් ඡන්ද ව්‍යාපරය තුල ඔහු දිගින් දිගටම පැහැදිලි කලේ ජනාධිපති ලෙස පත් වුවහොත් තමන් මහා ව්‍යාපාරිකයන්ගේ අවශ්‍යතා පරිදි කටයුතු කරන බවයි.

සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) සංවිධානය ශිෂ්‍යයන්ට අවධාරනය කරන්නේ මෙම ප්‍රෝඩාකාරී විරෝධතා ව්‍යාපාර ප්‍රතික්ෂේප කරන ලෙසයි. ශිෂ්‍යයන්ට තම අයිතීන් සඳහා සටන් කල හැක්කේ සමාජවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිනිස කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් පිහිටුවාලීම සඳහා පාලක පන්තියේ සියලු කොටස්වලින් ස්වාධීන වූ කම්කරු පන්තියේ දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගීමට දායක වීමෙන් පමනි. ප්‍රාථමික මට්ටමේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා ඉහල තත්වයේ නිදහස් අධ්‍යාපනයක් සියලු දෙනා සඳහා සහතික කරලීම පිනිස බිලියන ගනනින් මුදල් වෙන්කල යුතුව තිබේ. සමාජවාදී සමානතා පක්ෂයේ ශිෂ්‍ය සංවිධානය වන සසජාශි පෙනී සිටින්නේ එකී වැඩපිලිවෙල සඳහා ය.

© www.wsws.org